# උත්ථාන සමයේ තුන්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 8 : 26-40

**"ඔබ මුළු සිතින් විශ්වාස කරන්නෙහි නම් ස්නාපනය ලබා ගත හැකි ය."**

එකල ස්වාමින් වහන්සේගේ දූතයෙක් පිලිප්ට කථා කොට, "නැගිට දකුණ දෙස ජෙරුසලමේ සිට ගාසාවට බසින පාරට යන්නැ" යි කීය. එය කාන්තාර පාරකි. ඔහු එහි ගියේය. එවිට එතියෝපිය රට වැසියන්ගේ කන්දකීය නම් බිසව යටතේ බොහෝ බලය ඇත්තාවූ ද ඇගේ මුළු වස්තුවේ අධිකාරි වූ ද එතියෝපීය නපුංසකයෙක් වන්දනාව පිණිස ජෙරුසලමට ගොස් ආපසු යනවිට තමාගේ රථයෙහි හිඳ, දිවැසිවර ඉසයියස්ගේ පොත කියවමින් සිටියේය. එවිට ආත්මයාණන් වහන්සේ පිලිප්ට කථා කොට, " ඔබ ඉදිරියට ගොස් රථයට ළංව ගමන් කරන්නැ" යි වදාළ සේක. පිලිප් ඔහු ළඟට දිව ගොස් ඔහු ඉසයියස් දිවැසිවරයාගේ පොත කියවනු අසා, "ඔබ කියවන දේ ඔබට තේරෙන්නේදැ" යි ඇසීය. "යමෙකු මඟ පෙන්නුව හොත් මිස මට තේරුම් ගත හැක්කේ කෙසේදැ" යි ඔහු පිළිතුරු දී රථයට නැඟී තමා සමඟ හිඳ ගන්නට පිලිප්ගෙන් උදක්ම ඉල්ලීය. ඔහු කියවමින් සිටි ශුද්ධ ලියවිලි පාඨය මෙසේය. "මරණයට ගෙන යනු ලබන බැටළුවකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටළු පැටවකු මෙන් ද උන්වහන්සේ තමන් මුඛය නාරින සේක. උන්වහන්සේ නින්දා ලැබූහ. යුක්තිය නොලැබූහ, උන්වහන්සේගේ පෙළපත ගැන ප්‍රකාශ කරන්නේ කවරෙක්ද? මන්ද, උන්වහන්සේගේ ජීවිතය මිහිපිටින් පහකර දමන ලදි." නපුංසකයා පිලිප්ගෙන් විචාරමින්, "දිවැසිවරයා මෙය කරන්නේ කවරකු ගැනද? තමාම ගැනද නැතහොත් අන් කෙනෙකු ගැනදැයි මට කියන්නැ" යි කීය. එවිට පිලිප් පිළිතුරු දෙමින් එකී ශුද්ධ ලියවිලි පාඨයෙන් ජේසුස් වහන්සේ ගැන ඔහුට දේශනා කළේය. ඔහු මාර්ගයෙන් යද්දී, ජලය ඇති තැනකට පැමිණුනාහ. නපුංසකයා "මෙන්න, ජලය ඇත. බෞතීස්ම ස්නාපනය ලැබීමට ඇති බාධාව කුමක්දැ" යි ඇසීය. පිලිප්

කථා කොට ඔබේ මුළු සිතින් අදහන්නෙහි නම් එසේ කළ හැකියැ" යි පැවසීය. ඔහු උත්තර දෙමින්, "ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව මම අදහමි" යි කීය. රථය නවත්වන්නට අණ කළ පසු පිලිප් ද නපුංසකයා ද දෙදෙනාම වතුරට බැස්සෝය. පිලිප් ඔහු බෞතීස්ම ස්නාපනය කළේය. ඔවුන් වතුරෙන් ගොඩ ආ කල ස්වාමින් වහන්සේගේ ආත්මයාණන් පිලිප් හැර ගෙන ගිය සේක. නපුංසකයා නවත් ඔහු නුදුටුවේය. ඔහු ප්‍රීතියෙන් තමාගේ ගමන ගියේය. ඉන්පසු පිලිප් දක්නා ලද්දේ අසෝතස් හිදී ය. ඔහු කායිසාරියට පැමිණෙන තෙක් සියළු නුවර වල සැරිසරිමින් සුබඅස්න ප්‍රකාශ කළේය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 66:8-9, 16-17, 20

පිළිතුරː ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.

ගීයː

ජනතාවෙනි, අපේ දෙවිඳුන් හට ආසිරි පතන්න. එතුමන් වෙත නගන පැසසුම පතුරුවා හරින්න. එතුමාණෝ ජීවිතුන් අතර අප රැකගත් සේක. අපේ පාද නොපැකිළෙන්නට සැලසූ සේක.

දෙවිඳුන් නමදින සියල්ලෙනි! එන්න සවන් දෙන්න. එවිට එතුමාණන් මට කළ දේ මම කියා දෙන්නෙමි. මා මුවින් මම එතුමන්ට මොර ගැසුවෙමි. මාගේ දිවෙන් එතුමන්ගේ මහිමය ඉහළින් වර්ණනා කළෙමි.

දෙවිඳුන්ට ප්‍රශංසා වේවා! මාගේ අයැදුම එතුමාණෝ ඉවත නොදැමූ සේක. සිය පෙමින් මා ඈත් නොකළ සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!

"තෝමස් ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහිය. නුදුටු නමුත් අදහා ගන්නෝ භාග්‍යවන්තයෝ" යයි ස්වාමින් වහන්සේ වදාළ සේක.

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6 : 44–51

**"ස්වර්ගයෙන් පහළ වූ ජීවනදායක පූපය මම වෙමි"**

"මා එවා වදාළ පියාණන් වහන්සේ තමන් වෙත ඇද ගන්නා අයෙකුට මිස අන් කිසිවෙකුට මා වෙතට පැමිණිය නොහැකිය. මම අන්තිම දවසේදී ඔහු උත්ථාන කරන්නෙමි. 'සියල්ලෝම දෙවියන් වහන්සේ විසින් උගන්වනු ලබති' යි දිවැසාවලියෙහි ලියා ඇත. දෙවියන් වහන්සේට සවන් දී උන්වහන්සේගෙන් ඉගෙන ගත් සියල්ලෝම මා වෙත එති. දෙවියන් වහන්සේ වෙතින් පැමිණි තැනැත්වහන්සේ හැර, අන් කිසිවෙකු දෙවියන් වහන්සේ දැක ඇතැයි මෙයින් අදහස් නොකරමි. උන්වහන්සේ පමණක් පියාණන් වහන්සේ දැක ඇත. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. අදහන්නාට සදාතන ජීවනය ඇත. ජීවනදායක භෝජනය මම ය. ඔබේ පියවරු කාන්තාරයේදී මන්නා කෑහ. එහෙත් ඔව්හු මිය ගියහ. මේ වනාහි ස්වර්ගයෙන් බැස එන භෝජනය බැවින් එයින් පෝෂණය වන කිසිඳු මිනිසෙක් නොමැරෙන්නේය. ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක භෝජනය මම ය. යමෙක් මේ භෝජනයෙන් වැළඳුවොත්, ඔහු සදාකල් ජීවත් වන්නේය. මා විසින් දෙනු ලබන ඒ භෝජනය මාගේ මාංශය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිස ය" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.